**ශීර්ෂ 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂ 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 03 දින අධිකාරයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

## 2.1 විසර්ජන ගිණුම

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අධිකාරය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.24,330,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.23,475,078 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අධිකාරය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.854,922 ක් හෙවත් සියයට 4 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 23,130,000 | 22,917,292 | 212,708 | 1 |
| මූලධන | 1,200,000 | 557,786 | 642,214 | 54 |
| එකතුව | 24,330,000 | 23,475,078 | 854,922 | 4 |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අධිකාරයට අදාල විෂය අංක 00901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1,170,000 | 645,954 | 355,000 | 732,764 | 2,800,000 | 1,370,675 |

## 2.3 විගණන නිරීක්ෂණය

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

- -------------------------------------------

අධිකාරය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|
| පරිගණක,උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

### 3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

-------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2015 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.3 අනුකුල නොවීම්

-------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (i) ව්‍යවස්ථාපිත විධිවිධාන | | |
| 2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 7 වන ඡේදය | - | අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක්, ඒ අභියාචනය ලැබුණු දින සිට මාස 02ක කාල සීමාවක් ඇතුලත විභාග කොට අවසාන වශයෙන් සුදුස්සක් කල යුතු බව දක්වා ඇතත් 2015 වර්ෂයේදී හා 2015 වර්ෂයට පෙර ලැබුණු අභියාචනා නිම කිරීම සඳහා මාස 03 සිට වර්ෂ 11 දක්වා කාලයක් ගත වී තිබුණි. කාල විශ්ලේෂණය පහත දක්වා ඇත. |

| මාස 02 කට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 05 ට අඩු | වර්ෂ 05 ට වැඩි |
| --- | --- | --- |
| 199 | 423 | 05 |

අභියාචනා ඉදිරිපත් කළ නිලධාරින් එවායෙන් නිදහස් වීම ප්‍රමාද වීම නිසා ඔවුන් වෙත වඩාත් වැදගත් කාර්යයන් පැවරීමට හා පූර්ණ සේවයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.4 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අධිකාරයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

අධිකාරය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) අධිකාරය වෙත 2015 වර්ෂයට පෙර ලැබුණු අභියාචනා 588 ක් ඉදිරියට ගෙන විත් තිබුණ අතර 2015 වර්ෂයේදී එම අභියාචනා වලින් 160 ක් පමණක් නිමකර තිබුණි. මෙහි කාර්ය සාධනය සියයට 27 කි.

(ii) 2015 වර්ෂයේදී අභියාචනා 244 ක් ලැබී තිබුණු අතර 2015 වර්ෂය තුළදී ඉන් අභියාචනා 06 ක් පමණක් නිම කර තිබුණි.මෙහි කාර්ය සාධනය සියයට 02 කි . 2015 වර්ෂයේ සමස්ථ කාර්ය සාධනය සියයට 20 කි.

(iii) අධිකාරයේ 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම රු. 22,917,292 ක් වී තිබුණි. සුදුස්සක් කර අවසන් කර තිබූ අභියාචනා සංඛ්‍යාව 166 ක් වීම නිසා එක් අභියාචනයක් නිම කිරීම සඳහා රජය වැය කළ මුදල රු.138,055 ක් වී තිබුණි.

(iv) 2015 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව අවසන් කරන ලද අභියාචනා 166 න් 117 ක්ම නිෂ්ප්‍රභා කර තිබූ අතර අභියාචනයේ සඳහන් සහන ලබාදෙන ලද අභියාචනා සංඛ්‍යාව 35 ක් වී තිබුණි.

**3.5** අනාර්ථික ගනුදෙනු

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රජයේ තක්සේරුව මාසික කුලිය රු. 350,000 ක් වූ ගොඩනැගිල්ලක් මාසික කුලිය රු. 600,000 බැගින් ගෙවීමේ පදනම මත 2015 ජුනි 01 දින සිට වසර 03 ක් සඳහා ලබා ගැනීමට ගිවිසුම්වලට එළඹ තිබුණි. මේ අනුව රජයේ තක්සේරු වටිනාකම අභිබවා මාසික කුලී ලෙස රු. 1,750,000 ක්ද මුල් මුදල (key money) ලෙස රු. 1,500,000 ක්ද වශයෙන් එකතුව රු. 3,250,000 ක් ගෙවා තිබුණි. මුදල් රෙගුලාසිවල බාහිර පාර්ශවයන්ට අත්තිකාරම් ලබා දීමට ප්‍රතිපාදන සලසා නොතිබුණත් ගොඩනැගිල්ල කුලියට ගැනීමේදී මාස 6 ක කුලිය (key money) රු.3,600,000 ක අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**3.6** **කළමනාකරණ දුර්වලතා**

-------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පවිත්‍රතා සේවා සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.511,500 ක් ගෙවා තිබුණි. සේවා සැපයුම්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ප්‍රථම වෙළඳපල සැදහුම් ක්‍රමය යටතේ ආයතන 03 කින් ලංසු ඉදිරිපත් කර තිබුනත් ස්ථානිය පරීක්ෂාවේදී ආයතන 02 ක් පවිත්‍රතා සේවා සපයන ආයතන නොවන බව තහවුරු විය.

(ආ) අධිකාරය විසින් ආරක්ෂක සේවා සැපයීම සඳහා ගිවිසුමකට එළඹ තිබූ අතර එම ගිවිසුමෙහි සඳහන් කොන්දේසි අනුව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දක්වා ඇත.

(i) සේවයේ යොදවන නිලධාරීන්ගේ නම් ලිපිනයන් අත්සන් හැඳුනුම්පත් අංක සහිතව ඔවුන් පදිංචි ප්‍රදේශයේ සහතිකයක් ලබා ගත යුතු බව දක්වා ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ගෙවීම් කිරීමේදී ගෙවීමට පෙර ප්‍රධාන ලිපිකරු විසින් පැමිණීමේ සහතික පරීක්ෂා කළ යුතු වුවත් පැමිණීමේ සහතික පරීක්ෂාවකින් තොරව ගෙවීම් කර තිබුණි. 2015 වර්ෂයට අදාලව ගෙවා ඇති මුදල රු. 401,500 ක් විය.

**3.7** මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

-------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | - | 05 |
| (ii) | තෘතියික මට්ටම | - | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 12 | 09 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 05 | 02 | 03 |
| (v) | වෙනත් ( කොන්ත්‍රාත් පදනම) | - | 10 | - |
| | එකතුව | 22 | 21 | 11 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 11 ක් පැවතුණි. එම පුරප්පාඩු වූ තනතුරු සංඛ්‍යාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 03 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක්ද වශයෙන් තනතුරු 10 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි.